ලාහුගල ප්‍රාදේශීය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

------------------------------

1 **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත කිරීම**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 වැනි දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 08 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍යතත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

-------------------------------------------

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීඒ/ශ්‍රීලරාඅගිප්‍ර දරන පලාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සේවකයන්ගෙන් සේවක ණය අය කර ගැනීමේ දී වැඩිපුර අයකරගෙන තිබුණු රු.7,775 ක මුදලක් ගෙවිය යුතු ලෙස වෙනම පෙන්නුම් නොකර අනෙකුත් සේවකයන් ගෙන් අයවිය යුතු ශේෂයට හිලව්කර තිබුණි. එම නිසා සේවක ණය ගිණුමේ ශේෂය රු.7,775 ක් අඩුවෙන් පෙන්නුම්කර තිබුණි.

(ආ) වටිනාකම රු.94,765 ක් වූ අස්ථානගත වූ පුස්තකාල පොත් 1040 සම්බන්ධයෙන් සහ වටිනාකම හඳුනානොගත් අස්ථානගත වූ පුස්තකාල පොත් 241 ක් පිළිබඳව ගිණුම්වල ගැළපීම් කර නොතිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබු බැවින් එම වටිනාකම් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට හෝ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත්නොකළසාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 129,386,496 | - ස්ථාවර වත්කම් ලේඛණය |
| වරෙන්තු ගාස්තු හා දඩමුදල් | 1,552,791 | |
| කුලි ආදායම් | 135,000 | - ආදායම් ලේඛණය |
| අනෙකුත් ආදායම් | 144,982 | |
| ආදායම් ණයගැතියෝ | 26,983 | - ණයගැති ලේඛණය |

1.3.4 **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් නීති, රීති රෙගුලාසිවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ) ප්‍රාදේශීය සභා රීතිමාලාව** | |
| (i) රීති 59 - 66 | සභා ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අයකල යුතු කර්මාන්ත හඳුනා ගැනීමටත් බදු අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |
| (ii) රීති - 203 | 2013 වර්ෂය සඳහා සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණය සඳහා සභාවේ නියෝජිතයකු පත්කර නොතිබුණි. |

(iii) රීති - 218

ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකදීම පරීක්ෂා කල යුතු වුවත්, ප්‍රාදේශීය සභාව සතුව ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.47,976,952 ක් ලෙස දක්වා තිබුණද, ඒ පිළිබඳව වාර්ෂිකව පරීක්ෂා කර නොතිබුණි.

**(ආ)** **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>**

රෙගුලාසි 880

මුදල්, ගබඩා හා ආදායම් එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරීන් විසින් ඉදිරිපත් කළයුතු ඇපකර ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,142,861ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.950,056 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,092,917 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කළමනාකරණ අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

**(අ)** ලාහුගල පුස්තකාලයේ සහ පානම පුස්තකාලයෙහි පොත් 1281 ප්‍රමාණයක් අස්ථානගතවී ඇති අතර එම පොත්වලින් වටිනාකම හදුනාගත හැකි පොත් 1040 ක වටිනාකම රු.94,764 ක් විය. මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් මෙතෙක් ගෙන නොතිබුණි.

**(ආ)** වර්ෂ 10 කට පෙර සිට අපහරණය කිරීමට භාණ්ඩ සමීක්ෂණ කමිටු විසින් නිර්දේශකර ඇති පොත් 933 ක් අපහරණය කර නොතිබුණි.

**(ඈ)** සන්නිවේදන කුළුණු වලින් සහ ප්‍රචාරක දැන්වීම් වලින් ආදායම් එකතුකර ගැනීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්මතකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**(ඇ)** සභාව විසින් භාවිතාකරන පරිත්‍යාග ලෙස ලැබී ඇති කැබ් රථ 02, ට්‍රැක්ටර් 04, ටේලර් 05 හා වතුර බවුසරය සභාවේ නමට පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)** සභාවේ වතුර බවුසරයක් අලුත්වැඩියා කිරිමට වර්ෂ කිහිපයකට පෙර ගරාජයක් වෙත යවා තිබුණු අතර බවුසරය මෙතෙක් ලැබි නැති අතර ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රිය /ඌණ උපයෝජිත වත්කම්**

----------------------------------------

**(අ)** කැබ් රථයක්, ට්‍රැක්ටර් 04 ක්, ටේලර් 04 ක්, පාපැදියක්, අත් කරත්තයක්, සී කැට් බෝට්ටුව, යම හා ඇන්ජිම සහ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 02 ක් අබලන් තත්ත්වයේ පැවැති අතර ඒවා අලුත්වැඩියා කිරිමට හෝ අපහරණය කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට වසා දමා ඇති හුලන්නුගේ පුස්තකාලයේ පොත් ප්‍රයෝජනයට නොගෙන කාර්යාලයේ ගබඩාකර තිබුණි.

3.3 **ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය**

-----------------------------------

ප්‍රාදේශීය විශේෂ යෝජනා - 2013 යටතේ විවිධ ආයතනවලට බෙදාදීම සඳහා කසල බඳුන් 107 ක් එකක් රු.1,867 කට 2013 සැප්තැම්බර් මස 13 වෙනි දින මිලදිගෙන තිබුණ ද විගණිත දිනය වූ 2014 මැයි 07 දින වන විටත් කාර්යාල පරිශ්‍රයේ එම කසල බඳුන් වලින් රු.97,115 ක් වටිනා බඳුන් 52 ක් ගබඩාකර තිබුණි.

4 **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**
-------------------------------------

4.1 **අයවැය පාලනය**
--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම අතර සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛණයේ සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලනය**
-----------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතුය.

(අ) ගිණුම් තැබීම

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) පුස්තකාල පොත් පාලනය

(ඈ) අයවැය පාලනය